කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය - පළමු වසර

සෙමෙස්තර අවසාන පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2017/2018

**DMG 1204 : ශ්‍රී ලංකාවේ ප්‍රජාවිද්‍යාව**

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න                    කාලය: පැය දෙකයි (02)

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ

---

1. "අනෙකුත් දකුණු ආසියාතික රටවල් සමග සංසන්දනය කිරීමේදී ශ්‍රී ලංකාව සුවිශේෂී ප්‍රජාවිද්‍යාත්මක ගති ලක්ෂණ පෙන්නුම් කරන රටක් වශයෙන් හඳුනාගත හැකිය". මෙම කියමන නිදසුන් සහිතව විමසන්න.

(ලකුණු 20)

2. "ශ්‍රී ලංකාවේ සඵලතා සංක්‍රාන්තිය විවිධ වකවානුවල ඇති වූ ප්‍රජාවිද්‍යාත්මක, සමාජ සහ ආර්ථික වෙනස්කම්වල ප්‍රතිඵලයකි." මෙම කියමන විමසන්න.

(ලකුණු 20)

3. "තිරසාර සංවර්ධන ඉලක්ක වෙත ළඟාවීම තුළින් රටක ජනගහනයේ යහපත් සෞඛ්‍ය මට්ටමක් මෙන්ම මර්ත්‍යතාවයේ ශීඝ්‍ර පහළ බැසීමක් ද අපේක්ෂා කළ හැකිය." මෙම කියමන විමසන්න.

(ලකුණු 20)

4. අ) සංවර්ධනය වෙමින් පවත්නා රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ සංවර්ධන සැලසුම් සහ ප්‍රතිපත්ති සැකසීමේදී ජන සංයුතීන් පිළිබඳ අවධානය යොමු කිරීමේ ඇති වැදගත්කම නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) අභ්‍යන්තර සංක්‍රමණය කෙරෙහි බලපාන සාධක සංවර්ධනය වෙමින් පවතින රටවල උදාහරණ සපයමින් විමසන්න.

(ලකුණු 10)

5. අ) ජීවවිද්‍යාත්මක වියපත්වීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 05)

ආ) සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ජනගහනය වයස්ගතවීමේ අභියෝගය ආමන්ත්‍රණය කිරීමේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන ගැටලු විමසන්න.

(ලකුණු 15)

6. පහත සඳහන් මාතෘකා ගැන කෙටි සටහන් ලියන්න.

අ ) නාගරික දරිද්‍රතා ගැටලු

ආ) සරණාගතයින් සම්බන්ධ ගැටලු

ඇ) පුම්තිරි සංයුතිය හා සම්බන්ධ ගැටලු

ඇ) දරිද්‍රතාවය මුලිනුපුටා දැමීමේ වැඩසටහන්

(ලකුණු 05x04=20)